

# තරුවක් උනු පුංචි පීකාබූ

ආර්.එම්. යුවිනි සහස්නා වීරකෝන්

# තරුවක් උනු පුංචි පිකාචු

ආර්.එම්. යුවිනි සහස්නා වීරකෝන්

# තරුළුවක් උනු පුංචි පිකාචු

කතෘගේ නම

ආර්.එම්. යුවිනි සහස්නා වීරකෝන්

කතෘගේ වෙනත් කෘති

පොරි සීයට හිනාවක්

ඉගෙනුම ලබන පංතිය

3 ශ්‍රේණිය D

පාසල

මහ/මහමායා බාලිකා විදුහල

කෘතිය පළ කරන දිනය

2026/05/10

ISBN NO. IS49937

# පිදුම

මට දිරිදෙමින් අයනු ආයනු පහදමින් මඟ පෙන්වූ

පංති භාර වත්සලා ගුරු මෑණියන්ටත්,

1-2 ශ්‍රේණිය ප්‍රමිතා ගුරු මෑණියන්ටත්

අකුරු ලියන්නටත් කලින් චිත්‍ර කරවූ

රන්දිමා කළුආරච්චි ගුරු මෑණියන්ටත්,

අම්මා, අප්පච්චි සහ මගේ ආදරණීය අයියාටත්

සෙනෙහසින් පිළිගන්වමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දෑයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළඳා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි. අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය. මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
**2026-05-10**

# සුභාශිංසන පණිවුඩය


වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළුආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි. ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව




ලස්සන නුවරක ගුණයහපත් ලස්සන ගැහැණු ළමයෙක් හිටියා. එයාගේ නම අයෝකි.

එයා අතින් අයට වඩා ගොඩක් වෙනස්. එයා වැඩියෙන්ම කළේ අසරණ සත්තු, මිනිසුන්ට උදව් කරපු එක.




ඒ අතර පාරවල් වල දාලා ගිය බල්ලෝ, පූසෝ, රිලව්, වාහනවලට හැප්පුණු සත්තු, ඇස් පේන්නේ නැති සත්තු, අත් කකුල් කුණු වෙලා පණුවෝ හැඳුනු සත්තුන් හිටියා.

තව මරණයට කැප වෙලා හිටපු ඌරෝ, එළුවෝ, හරක් වගේ සත්තුත් හිටියා.



තව අසරණ දුප්පත් පුංචි දරුවන්ට පොත් පෑන් පැන්සල් වගේම ඇඳුම් ලබා දුන්නා. හැමෝම සතුටු වෙනවා බලලා අයෝකි ගොඩාක් සතුටු වුනා.




එයාට හැමදාම අලුත් දවසක් උනා. කොහේ හරි ඉන්න අසරණ සතෙක් ගැන එයාට තොරතුරු ගොඩක් ලැබෙනවා.

එයාට පුළුවන් අයව එයා බේරා ගන්නවා.




දවසක් එයාට ගොඩක් දුර පළාතකින් පණිවිඩයක් ලැබෙනවා. ඒ අයිතිකාර අය අතෑරලා දාපු හරි ලස්සන බලු පැටියෙක් ගැන. එයා ගැන විස්තර අහපු අයෝකිට ගොඩක් දුක හිතෙනවා.
එයාගේ යාළුවොත් එක්ක පිටත් වෙනවා අසරණ බලු පැටියාව බේරා ගන්න.

උදේම පිටත් වුනු අයෝකිට ගොඩක් හවස් වෙලා තමයි බලු පැටියා ඉන්න තැනට යන්න පුළුවන් උනේ. ඒ යන කොටත් ඇවිදගන්න බැරි තරමට කකුල් තුවාල වෙලා කන්න නැති නිසා පණ නැතිව ගොඩක් අසරණ වෙලා තමයි ඒ බලු පැටියා හිටියේ.



එයාව දැක්ක අයෝකිටයි එයාගේ යාළුවොන්ටයි ගොඩක් දුක හිතුණා. කකුල් වල ඇට කටු පේන තරමට ලොකු තුවාල. අනේ හරිම දුක හිතෙන විදිහට එයා අයෝකි දිහා බලාගෙන හිටියා. බලු පැටියා අයෝකි දුන්න යෝගට් එකයි බිස්කට් ටිකයි එක හුස්මට කෑවා.




අයෝකි ඉක්මනට බලු පැටියා අරගෙන දොස්තර මාමා කෙනෙකුට පෙන්නන්න ගියා. ගොඩක් පරික්ෂණ කරපු දොස්තර මාමා කිව්වේ ගොඩ කාලයක් කෑම නැතිව ආදරේ නැතිව එයා ගොඩක් ලෙඩ වෙලා ඉන්නේ කියලා. අයෝකි බලු පැටියාව තුරුළු කරගෙන හොදටෝම ඇඬුවා. ඒ වෙලාවේ අයෝකි කිව්වේ ''ඔයා ආයේ කවදාවත්ම තනි වෙන්නේ නෑ. ඔයාට යාළුවෝ ගොඩක් ඉන්නවා.මං ඔයාට රස රස කෑම ගොඩක් දෙන්නම්'' කියලා.

බලුපැටියා හරි ආදරෙන් අයෝකි දිහා බලලා අයෝකිගේ අත ලෙව කෑවා.


ඒ වෙලාවේ අයෝකි ''මං ඔයාට පිකාචු කියන්නම්'' කියලා කිව්වා.

එදා ඉදං එයාගේ නම පිකාචු.





පිකාචු බෙහෙත් බොන ගමන් ටික ටික සනීප උනා. එක පාරටම ලෙඩ උනා. ආයෙත් බෙහෙත් බොන කොට හොඳ උනා. අයෝකිගේ ගොඩක් ආදරේ එයාට ලැබුණා. රස කෑම බීම එක්ක එයාට යාළුවෝ ගොඩක් ලැබුණා. අතක් නැති චාන්දනි බලු පැටියා, සුද්දි එළුවා, බානබස් ඌරු පැටියා වගේ ගොඩක් අය ඒ අතර හිටියා.





සතුටින් හිටපු පිකාඩු නිතරම ලෙඩ උනා. දොස්තර මාමා හැමදාම බෙහෙත් කළා. ඒත් පිකාචු බේරා ගන්න බැරි තරමට දුර්වල උනා. අයෝකිට හරිම දුකයි. පුංචි පිකාචු එයාට ගොඩක් ආදරේ දුන්නු ආදරෙන් බලාගන්න එයාගේ ආදරණිය අක්කා දිහා ගොඩාක් දුකෙන් බලාගෙන යන්නම ගියා.

අයෝකිට ගොඩක් දුකයි. එයා ගොඩක් ඇඬුවා. එයා පුංචි පිකාචු වෙනුවෙන් ගොඩක් පිංකම් කළා. තවත් අසරණ සත්තුන්ට කෑම දුන්නා. බෙහෙත් කළා. අයෝකිට පුළුවන් උනා තනියම අසරණව හිටපු පුංචි බලු පැටියෙකුට ගොඩාක් ආදරේ කරලා රස කෑම දීලා සතුටින් තියන්න. ඒ වගේම එයා අහස දිහා බලාගෙන තරුවක් වෙලා අහසට ගිය පුංචි පිකාචු එක්ක කතා කරන්න ගත්තා. අයෝකිට හිතෙන්නෙම පුංචි සුරංගනාවියෝ ලස්සන පුංචි පිකාචුව අරං ගියේ මෙහෙදි එයා ගොඩක් අසනීප වෙන නිසා කියලා.

අදටත් අයෝකි අසරණ සත්තු සිය දහස් ගණනකගේ ජීවිත ලස්සන කරනවා.



පුංචි අපිත් අපිට පුළුවන් විදිහට අසරණ අයට උදව් කරනවා නම් දුකින් ඉන්න කෙනෙකුට සතුටක් වෙන්න පුළුවන් එයාලට ඒ ලැබෙන සතුට ආයේ කවමදාවත් ලැබෙන්න නැති වේවි. හරියට අයෝකි ලස්සන කරන අසරණ සත්තුන්ගේ ජීවිත වගේ.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දෑයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්නමගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ගා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්ථ වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාරය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN NO. IS49937